**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය - 2021**

**------------------------------------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 මතය

**------**

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශණය සහ මූල්‍ය ප්‍රකාශණ වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

**------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, ආයතනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය, ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක ආයතනය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් පිරිමැසුම්දායීව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට රු. 31,044,679 ක් වූ මුළු ණයගැති ශේෂයෙන් විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැතියෝ හැර අනෙකුත් ණයගැති ශේෂයෙන් රු. 533,296 ක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට අය නොවී පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. මෙම ණය ශේෂය තුළ රු. 498,326 ක මුදලක් සේවකයින්ගෙන් අයවිය යුතුව ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. | උක්ත ශිෂ්‍යත්වලාභී ණයගැතියන් 06 දෙනාගෙන් 05 දෙනෙකුගේ වර්තමාන ලිපිනයන් සොයා ගැනීමට නොහැකි වීම නිසා ණය අයකර ගැනීමේ ඉදිරි පියවර ගැනීමට නොහැකි වී ඇත. අනෙක් ණයගැතියා වෙනුවෙන් නඩු කටයුතු සිදු වෙමින් පවතී. නඩුව සමතයකට පත් නොවුණද එම ණයගැතියා විසින් වරින්වර ආයතනයේ ගිණුමට රු. 580,000 ක් බැරකර ඇත. | අයවිය යුතු ශේෂ නොපමාව අයකර ගත යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට ආයතනයේ 2002 වර්ෂයට පෙර සිට පැවත එන විදේශ ශිෂ්‍යත්වලාභී ණයගැතියන් 06 කගෙන් රු. 12,859,881 ක මුදලක් අයවිය යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයේදී එම ණයගැතියන් 05 කගෙන් කිසිඳු මුදලක් අයකර නොතිබුණි. | මෙම මුදල අයකර ගැනීමට සිහි කැඳවීම් අදාළ සේවකයින් හට යවා ඇති නමුත් ඊට ප්‍රතිචාර දක්වා නොමැත. 2022 ජූනි 06 දින නීතිපති උපදෙස් සඳහා ආයතනයේ නිලධාරීන් නීතිපති දෙපාර්තමේන්තුව විසින් කැඳවා ඇති අතර ලබාදෙන උපදෙස් මත ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. | පරීක්ෂණ සිදුකර මුදල් අයකර ගත යුතුය. |

### 1.5.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු. 19,681,654 ක ණයහිමි ශේෂය තුළ රු. 643,706 ක වර්ෂ 05 කට වැඩි කාලයක සිට නිරවුල් නොකළ ශේෂයක් පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. | පාරිතෝෂිත මුදල් ගෙවා නොතිබීම, දැනුවත් කළද මුදල්වලට හිමිකම් නොපෑම, කොන්ත්‍රාත්කරුවන් රඳවාගැනීමේ ගාස්තු ඉල්ලුම් නොකිරීම, කාලය ඉකුත් වීම මත අවලංගු කරන ලද චෙක්පත් සම්බන්ධයෙන් ගිණුම්වල ගැලපීම් සිදු නොකිරීම, ටෙන්ඩර් සහ ඇප තැන්පතු නිදහස් කිරීමට නොහැකි වීම, රියදුරුගෙන් අය කළ පසු අමාත්‍යාංශයට ගෙවිය යුතු වීම, ආහාර සුරක්ෂිතා පිළිබඳ අවශ්‍යතා ඇගයීම් අධ්‍යයනයට ලද මුදල් පිළිබඳව ගිණුම්වල අදාළ ගැලපීම් සිදු නොකිරීම හේතුවෙන් අදාළ මුදල් නිරවුල්ව නොමැත. | නොපමාව මුදල් ආපසු ගෙවීම හෝ හිමිකම් නොපාන්නේ නම් ආදායමට බැර කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| මු.රෙ. 211 | 2019 – 2021 කාලසීමාව තුළ විදුලි බිල්පත් අප්‍රමාදව නිරවුල් නොකිරීම නිසා රු. 25,929 ක අධිභාරයක් ගෙවා තිබුණි. | අදාළ බිල්පත් ගෙවීම ප්‍රමාද වීමට වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීම හා ඊට අදාළ කරුණු පරික්ෂා කර වගකිව යුතු පාර්ශවයන් නම් කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුවේ නිර්දේශ අනුව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | නොපමාව විදුලි බිල්පත් නිරවුල් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 12,133,601 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 16,201,196 ක් විමෙන් ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ රු. 28,334,797 ක මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයක් නිරීක්ෂණය විය. රජයේ ප්‍රදාන රු. 26,669,338 කින් වැඩිවීම, පර්යේෂණ හා පුහුණු කටයුතු සඳහා ලද ප්‍රාග්ධන ප්‍රදාන රු. 7,192,746 කින් වැඩිවීම මෙම මූල්‍ය ප්‍රතිඵලය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂය සමඟ සමාලෝචිත වර්ෂය සැසඳීමේදී රජයේ ප්‍රදාන හා ප්‍රාග්ධන ප්‍රදාන පිළිවෙලින් සියයට 17 කින් හා 1439 කින් වැඩිවී තිබුණු නමුත් වෙනත් ආදායම් සියයට 10 කින් අඩුවී තිබුණි. එසේම පර්යේෂණ හා පුහුණු වියදම් සියයට 406 කින් හා වෙනත් වියදම් සියයට 17 කින් වැඩිවී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම් අතිරික්ත අනුපාතය සියයට 3.24 කින් අඩුවී ඇති අතර ජංගම අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය පිළිවෙළින් සියයට 0.24 කින් හා සියයට 0.23 කින් වැඩිවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2012 - 2015 කාලපරිච්ඡේදය තුළ රු. 1,031,020 ක පිරිවැයක් දරා ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත කර තිබූ ජීව වායු ඒකකය 2016 වර්ෂයේ සිට ක්‍රියා විරහිතව පැවති අතර, ඒ වෙනුවෙන් 2018 වර්ෂයේදී රු. 22,500 ක් අත්තිකාරම් වශයෙන් ගෙවා බැලූනයක් මිලදී ගෙන තිබුණද ඒකකයේ අනෙකුත් ක්‍රියාකාරිත්වයන්ගේ දෝෂ පැවතීම තුළ එම බැලූනය ස්ථාපිත කර නොතිබුණු අතර 2021 දෙසැම්බර් 31 දින වන විට ඒකකයේ මුළු වියදම රු. 1,053,520 ක් වී තිබුණි. එය දීර්ඝ කාලයක් අලුත්වැඩියා නොකර තිබීම හේතුවෙන් එහි උපාංග අක්‍රිය වී නැවත භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්වී තිබුණි. මේ සම්බන්ධව මු.රෙ. 104 පරීක්ෂණයන් පැවැත්වීමට කමිටුවක් පත්කර තිබුණු අතර එම කමිටු වාර්තාව ලබාදී නොතිබුණි. | සාමාජිකයින් විශ්‍රාම යාම, අමාත්‍යාංශයේ නිලධාරින් ස්ථාන මාරුවීම වැනි හේතු මත නව නිලධාරින් මේ සඳහා පත් කිරීමට සිදු වීම නිසා පරීක්ෂණ වාර්තාව ලබා දීම ප්‍රමාද වී ඇත. මෙම කමිටුව අවසන් වාර්තාව සකසමින් සිටින බව දැනුම් දෙන ලද අතර කඩිනමින් මෙම වාර්තාව ලබා ගැනීමට කටයුතු කරමි. | අප්‍රමාදව පරීක්ෂණ කමිටු වාර්තාව ලබාගෙන නිර්දේශ එහි ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | කෘෂිකර්ම අමාත්‍යවරයාගේ ආරක්ෂක නිලධාරීන් සඳහා නේවාසිකාගාරයේ කාමර කුලියට දීම වෙනුවෙන් 2015 මැයි සිට 2018 ජූලි මස දක්වා කාලයට අයවිය යුතු රු. 8,895,470 ක මුදල ලැගුම්ගත් අයගෙන් හෝ මේ සඳහා අවසර ලබාදුන් නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ අයවිය යුතු මුදල අයකර ගැනීම සඳහා සිහි කැඳවීම් ලිපි යවා ඇතත් මේ දක්වා කිසිදු ප්‍රතිචාරයක් ලැබී නොමැත. එම මුදල් අයකර ගැනීමට නීත්‍යානුකූල පියවර ගැනීමට තරම් ලියවිලි, සටහන් හා අනෙකුත් කරුණු ප්‍රමාණවත් නොමැත. | කුලී ගාස්තු අය කරගත යුතුය. |

### 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයේදී රු. 89,000 ක් වැය කර මිලදී ගෙන තිබුණු කැමරාවක් ආයතනය තුළ නොතිබීම සම්බන්ධයෙන් මු.රෙ. 104 පරීක්ෂාවන් සිදු කිරීමට කටයුතු කර තිබුණද අදාළ කමිටුව වාර්තා ලබාදී නොතිබුණි. | මු.රෙ. 104 පරීක්ෂණයක් සිදු කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර එම වාර්තාව අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතව ඇත. එම වාර්තාව ඉදිරියේදී ලබා දීමට කටයුතු කරනු ලැබේ. | අප්‍රමාදව කමිටු වාර්තාව ලබාගෙන එහි නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.3 වාහන පද්ධතිය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් ආයතනය වෙත ලබා දී ඇති අංක 40 – 3933 දරන වාහනය නීත්‍යානුකූලව හිමිකාරීත්වය ආයතනය වෙත පවරාගෙන නොමැති අතර 2015 වර්ෂයේ සිට අභාවිතව පැවතුණි | 40 - 3933 දරන වාහනය ධාවනයට නුසුදුසු තත්වයේ පවතින අතර එම වාහනය ආයතනයට පවරා ගැනීම සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවන බවත් පවරාගැනීමෙන් ආයතනයට අලාභයක් සිදුවේ. දැනට එම වාහනය කිසිසේත් ධාවනයට ගත නොහැකි තත්ත්වයේ පවතී. ඉදිරියේදි මෙම වාහනය සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ උපදෙස් මත කටයුතු කරමි. | වාහනයේ අයිතිය පවරාගෙන අලුත්වැඩියා කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය.

### 4.1 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 හා 2020 වර්ෂවල වාර්ෂික කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2019 හා 2020 වර්ෂවල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තු සභාගත කිරීමේ ප්‍රගතිය විස්තරාත්මකව දක්වා ඇත. | නොපමාව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය |
| (ආ) | 2020 අගොස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ දක්වා ඇති ආකෘතිය ප්‍රකාරව තිරසාර සංවර්ධන අරමුණු (SGD) සපුරා ගැනීමේ කාර්යසාධනය වාර්ෂික වාර්තාවේ දක්වා නොතිබුණි. | තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීම කාර්ය සාධන වාර්ෂික වාර්තාවට මේ වන විට ඇතුළත් කර සංශෝධනය කර ඇත. ඉහත චක්‍රලේඛය ප්‍රකාර සම්පූර්ණ කරන ලද ආකෘතිය මේ සමඟ අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |